# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 ඔක්තෝබර්

**මානවශාස්ත්‍ර පීඨය**

**සිංහල (පැරණි නිර්දේශය)**

**(අධ්‍යයන වර්ෂ 2014 සිට 2016 දක්වා)**

**සිංහල ගද්‍ය සාහිත්‍යය, නාට්‍ය හා සිනමාව SINH – E2015**

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

## I කොටස

01. පහත සඳහන් ඡේදවල අදහස ලිහිල් බසින් ලියා කතුවරයා සතු අවස්ථා නිරූපණ කුසලතාව පිළිබඳ ඇගයීමක් කරන්න.

අ)

කුමර "මම් කෙත් හැඳින බිජ් පිහට්වමි. ජාතිමත් වේද දන්නා බමුණෝ සරු කෙත්හ" යි කී යැ මහසත් "ජාතිමදමාන ලොභද්වෙෂමොහයෝ යම් යම් කෙනෙකුන් කෙරෙහි ඇද්ද, ඔහු ඇසිවසත් පිරුණු තුඹස් වැන්නහ. ඔවුනට දුන් දනහි ඵල මහත් නො වෙයි. යම් කෙනෙකුන් කෙරෙහි, ජාතිමදමානලොභද්වෙෂයෝ නැද්ද, මෙත්කුළුණුනුවණ ඇද්ද, ඔහු සියුම්යුරු පිරුණු බඳුන් වැන්නහ. ඔවුනට දුන් දනැ ඵල මහත් වෙයි එ දන තට සුගිසපුව ගෙණ දෙන්නේය" යි කීය. මෙසේ මහසත්හු පුන පුනා සිල්වත් ගුණවත්නට දුන් දනැ ඵල මහත් පරිදි කියත් කියත් දඬුයෙන් පහළ ඇසිවසක්හු සෙයින් කුපිත වැ "මෙතුන් දොරටුයෙහි ගොව්වෝ කොයට ගියහ?" කී ය. ඔහු අවුදු වෙළෙයි ව වැඳ සිටියාහ. මොහු කුමට වැද්දැ දුන්ව?" යි කී ය. "වදනා කලැ නො දුටුම්හ. 'මෙනම් තැනෙක ගෙණ අය යනු නො ද දන්මහ. මායාකාරයෙක් දෝ හෝ? විද්‍යාධරයෙක් දෝ හෝ? අප විසින් කළ මනා කිමෙක් දැ?" යි කීහ. "මොහු මුහුණ පැහැර තළා පියා දඬුයෙන් හුණුපත්තෙන් සිපා පිට වරළු නඟා පියා කර ගෙණ සත්වන දොරටුයෙන් පිටතට නෙරපියව" යි කී යැ.

ආ)

අද කලි මෙ ඇත් වනාහි ඒ බුදුන්ගේ රූපාග්‍රප්‍රාප්ත වූ ආත්මභාවය මහනෙල් මල්දමක් ගහටගහටා සුණුවිසුණු කරන්නා සේ සතර පාහස්සෙහි ලා මැඩැ සුණුවිසුණු කොට අත්පා වෙනවෙන තෝරා මැස්සක ගහටන්නාසේ ගහටා දමයි. අද අප සතුරාණන් පිටු දකුම්හ" යි සැරසුනහැ. බුදුබල දන්නා ශ්‍රද්ධාසම්පන්නයෝ "අද අපගේ ස්වාමි වූ තිලෝගුරු සම්‍යක්සම්බුද්ධයන්ට ඇතෙක් නම් කුමක් කෙරේ ද? ඥාණබලයෙන් මුළුලොව දිනූහැ. කායබලයෙන් කෙළදහසක් ඇත්නට බල ඇත්තාහැ. දැන් සවාසනසර්‍වක්ලේශයන් නසා බුදු වූ කල්හි තබා තමන් බුදුවන්ට බෝමැඩ වැඩ හුන් දවස් පොවා තමන්ගේ ආනුභාවයෙන්, වසවර්තිමාරයා නැඟි යෙළසියයක් යොදුන් ගිරිමෙබලා නම් මතැත්හු මද සිඳුවාපියා තමන් ශ්‍රීපාදයට නුදුරුතන්හි කෙසරසිංහයක්හු දුටු ජරායෙන් රෝම වැම්මැ හී ගිය මාලු කැණහිලක්හු සේ වෙවුලුම් ගන්වා දළ බිමැ අන්වා පිටැ හුන් මරහු මුහුණින් වැටී හෙන පරිද්දෙන් නැමී වඳනා වැඳුම් ගත්හැ.

02. අනුරාධපුර යුගයේ ගද්‍ය සාහිත්‍යය පිළිබඳ සනිදර්ශනාත්මක විග්‍රහයක් කරන්න.

03. බුත්සරණ කතුවරයා සතු වර්ණනා චාතුර්යය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

නැතහොත්

පහත සඳහන් කෘති අතරින් එකක් පිළිබඳ සමාලෝචනයක් කරන්න.

ආ) අමාවතුර

ආ) සද්ධර්මරත්නාවලිය

ඇ) සද්ධර්මාලංකාරය

## II කොටස

04. සිංහල ප්‍රබන්ධකථාවේ ප්‍රභවය කෙරෙහි බලපෑ හේතු සාධක පිළිබඳ විමසීමක් කරන්න.

05. බැද්දේගම නවකතාවේ සාර්ථකත්වය සඳහා ඉවහල් වූ මුඛ්‍ය ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

06. පහත සඳහන් කෙටිකතා අතරින් එකක් පිළිබඳ විචාරයක් කරන්න.

අ) දියමන්ති මාලය
ආ) නිල් මැස්සා
ඇ) ගතු කියූ හදවත

## III කොටස

07. ශාකුන්තලා නාට්‍යයේ චරිත නිරූපණයේ ඉස්මතු වී පෙනෙන සුවිශේෂ ශක්‍යතා පිළිබඳව සසාධක විග්‍රහයක් කරන්න.

08. ඇරිස්ටොෆනීස්ගේ මැඩියෝ නාට්‍යයෙහි නිරූපණය වන සමාජ විවේචනය කෙබඳු දැයි නිදසුන් සහිත ව පරීක්ෂා කරන්න.

09. "සිනමාව සෙසු කලාවන්ගෙන් වෙනස් ව ස්වාධීන ව ගොඩනැගුණු කලාවකි." විභාග කරන්න.

10. පාර දිගේ චිත්‍රපටය පිළිබඳ ප්‍රමාණවත් විචාරයක් කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි.)

*********************************